"සැහැසි දනව්ව", ජාතික දේශපාලන ගැටළු කලා කෘතියක් තුළ ඇතුළ් කිරීම

යුද්ධය කියන්නේ මිනිසුන් උන්හිටි තැන්වලින් උගුල්ලා එහෙට මෙහෙට විසි කරන පොඩි කරන අවධියක් හරහා යාමයි. ඒ වගේ වෙලාවක හැමටම ප්‍රශ්නයන්ට මුහුණ දීමට සිදු වෙනවා. තමන්ගේ මනුස්සකම එළියට එන්නේ ඒ වෙලාවට. තම හැඟීම්වල සංකීර්ණ අවස්ථා, සදාචාරමය අර්බුද, තමා ගැනම ඇතුළට කිමිදිලා බැලීම මේ ආදී සියල්ල යුද්ධයක් තුළ යථාර්ථයක් වෙනව. එහෙම නම් කලාකරුවන්ට අද එය විශේෂ අවස්ථාවක්. මොකද? අප අද අත්විඳින දේ ගැන ප්‍රශ්න කිරීම තුළින් හා ඒ හරහා නැවත නැවතත් අප ගෙන යාමෙන් අළුත් හැඟීම් අපට හඳුන්වල දෙන්න පුළුවන්. ලෝකේ දිහා බැළුවත් මෙවැනි බැරෑරුම් අවස්ථාවලදී විනිවිද දකින කලාකරුවෝ බිහිවෙලා අළුත් මිනිස් ප්‍රවේශයක් අපට ළං කරලා දුන්න. ඒත් ලංකාව මේ තරම් කල් යුද්ධයේ පැටලී තිබුණත් එයින් අලුත් අත්දැකීම් අපට ගෙන දෙන්නට පුළුවන් වුණේ කිහිප දෙනෙකුට පමණයි. සමහරු එම ප්‍රශ්නයට බැස්සෙම ප්‍රචාරක මෙහෙයුමක් හරහාමයි. ඒ නිසා ඒවා ප්‍රචාරකවාදී වුණා. එසේ නොවී හදපු කලා කෘති ඉතාම අතළොස්සයි. "සැහැසි දනව්ව" මේ අඩුපාඩුව නැතිව යුද්ධයෙන් මතු වන මනුස්ස ගැටළු හදාරන්ට උත්සාහ කළා.

යුද්ධයට යට වුණ මායිම් ගම්මානයක් ඉතාම දරුණු දිළිඳුකමට හා පීඩනයට පත් වෙනව. අපි සාමාන්‍යයෙන් හිතන්නේ මෙවැනි සමාජයක ජනතාව සත්තු වගේ ජීවත් වෙනව කියලයි. ඒත් මනුස්සයා පීඩනයට පත් වුණත් හැඟීම් නැති සතෙක් වගේ ක්‍රියා කරන්නේ නෑ. විශේෂයෙන් ගැහැණිය මේ දරුණුකම තුළිනුත් ජීවිතය ගෙන යාම සඳහා ලොකු සටනක් නිහඬව ගෙනියනවා. මනුස්ස අම්මා කෙනෙක්ගේ චරියාව තිරිසන් අම්මා කෙනෙක් වගේ ප්‍රතික්‍රියාවට සීමා වෙන්නේ නෑ. ඇය දැනුවත්වම මව් සෙනෙහසින් ජීවිතය දිහා බලනව. එය දිළිඳුකමින්, බිහිසුණුකමින් වළලන්නට බැහැ. අම්මා කෙනෙකුට ජීවිතය අත්හරින්න බෑ. අනෙකාගේ ජීවිතය ඉවත දමන්නත් බෑ. මනුස්ස සමාජයේ බර ඇය කරට ගන්නව. මේ අනුව තමා "සැහැසි දනව්වේ" ඉහළ, පොහොසත් සමාජයෙ දකින්න බැරි ඉහළම සෙනෙහස හා පරිත්‍යාගය අපට ගෙනැවිත් පෙන්වන්නේ.

පිරිමියාගේ ආදරය වීර ක්‍රියාවක්. තම දරුවා පවුල වෙනුවෙන්, වර්ගය වෙනුවෙන් ජීවිතය කැප කරල ඒ ගැන ගරුසැලකිලි බලාපොරොත්තුව යටි හිතේ තියෙනව. ඔහුගේ රක්‍ෂණය බලාපොරොත්තු වන ගැහැණිය ඔහු වෙනුවෙන් කැප වී පිරිසිදුව සිටිය යුතුයි. තමාගේ බුක්තිය අනුන්ට නොදිය යුතුයි. අනෙක් අතට තමන්ගේ වෙලාවට එම බුක්තිය ලබාගන්නා ඔහුට එය අමතක කර යන්නටත් පුළුවන්. එහෙම නම් චපලකම තමන්ට අයිතියක්. ගැහැණිය සදා පිරිසිදුව බලා සිටිය යුතු වුවත් තමන් අවස්ථාවාදීව සම්බන්ධකම් හදාගන්න පුළුවන්. ඒ ගැන ගැහැණිය තමන්ට ණය ගැතිව සිටිය යුතුයි. මේ දෙපිටකාට්ටු පිරිමි චරිතය සැමියා සිරිපාලත්, හමුදා භටයත් මොන තරම් ලස්සනට ඉදිරිපත් කළාද? මේ බිහිසුණු ලෙස ඇද වැටුන මායිම් ගම්මානයේ සමාජය තුළත් පිරිමියාගේ ද්විත්ව චරිතය හැම පැත්තෙන්ම විමසා බලන්නට අවස්ථාවක් සැමියාත්, යුධ කඳවුරේ සෙබළාත් අපට ලබා දෙනවා.

දෙමළ විමුක්ති සටන සඳහා ත්‍රස්තය යොදා ගැනීම තුළින් අහිංසක පවුල් විනාශ වෙනවා. ත්‍රස්තයට සදාචාරයක් නෑ. යුක්තියක් නෑ. අම්මා අප්පා මරණ හැටි බලා සිටිය දරුවා මානසිකව අවුල් වූ ආබාධිතයෙක් වෙලා. හමුදා භටයට මොහු ගැන කණගාටුයි. ගැහැණිය විඳින දුක ගැනත්, අසරණකම ගැනත් ඔහුට වේදනාවක් නැතිවා නෙවෙයි. ඒත් ඔහුගේ බලාපොරොත්තුව කොන්ත්‍රාත් කාලය ඉවර වෙලා නීතිය අනුව ගෙදර යන එකයි. ඔහුගේ මනුස්සකම එම හමුදා සැලසුම විසින් සීමා කරල. හමුදා කඳවුරු නීති රාමුව තුළ තමන් හිර වුණත් ඉහළ නිළධාරින්ට ජීවිතය බයිට් හා මිවිත තුළ ගෙනිත්යන්නට ඉඩ ලැබිලා. මහත්තුරුන්ගේ හොඳ හිත දිනාගෙන ජීවිතය ගැටගහගන්න හමුදා භටයා හිත හදාගෙන ඉන්නේ. ඔහු වීර රණ විරුවෙක් නෙවෙයි. මහත්තුරුන්ගේ හිත දිනාගෙන කොන්ත්‍රාත් කාලය අහිංසකව ගෙවන ජීවිතයක්. ගැහැණියටත්, ගොළු දරුවටත් ඔහු ආදරෙයි. ඔහුට දුකයි. ඒත් කඳවුරේ කාලය ඉවර වුණාම ඔහු යා යුතුයි. එයා වීරයෙක් නෙවෙයි.

සිංහල ගම්මානයක් මායිමේ තිබෙන්නට පන්සල වැදගත් සංකේතයක්. එහි වැඩවසන සාදු යුද්ධයත්, ජනජීවිතයත් එකට ගැට ගසන බලයක්. මේ බලයේ සරණ පළාතේ මැතිඇමතිවරුන්ගේ සරණට වඩා වැදගත්. මොකද? එය දොරකඩ තිබෙන සිවිල් බලයක්. පොලීසිය, උසාවිය වාගෙම සහනාධාර සේවයත් එයයි. පන්සලේ සාදු ඇත්තටම රහතුන් වහන්සේ කෙනෙක් වගේ. අසරණ සරණ කියන වචනයේ පූර්ණ අරුතින්ම උන්වහන්සේ ගමට සරණ වෙනව. අර ළඟදී මරා දමපු නන්දරතන සාදු වගේ. ඒ තරම් අධිෂ්ඨානයක්, වීර්යයක් අවශ්‍යයි මායිම් ගමක පන්සලක් කරගෙන යන්න.

උන්වහන්සේ හැම ආරවුලකටම විසඳුම් දෙනව. අභියෝගවලට මුහුණ දෙනව. ඒත් අන්තිමේදී ලොකුම ගැටළුවක් ඉදිරියේ අසරණ වෙනව. ඒ ගැටළුවට විසඳුම හොයන්න සාදුට යුද්ධය හරහා පීනන්න වෙනව. ජාතික දේශපාලන ගැටළුව කලා කෘතියක් තුළ ඇතුල් කිරීම ගැන මට විරුද්ධ වෙන්න බෑ. මගේ දේශපාලන උවමනාවට එය කදිමට ගැලපෙනව. ඒත් මාක්ස්වාදී කලා විචාරය තුළ කලාවේ නිදහස හා අනන්‍යතාවය ගැන අවධාරණය කළ යුතු වෙනව. එක පාරටම ජාතික ගැටළුව සාදු හරහා නාට්‍ය තුළට ආපු එක තුළ කලා රසයට හානියක් වුණා කියලා මට කියන්න වෙනව. ඔයිට වඩා නිසහ ලෙසට නොදනෙන්න එය ගොඩනගන්න තිබුණා කියලා මට හිතෙනව. මං අසරණයි. මට කියන්න බෑ කොහොමද ඒක කරන්නේ කියලා. ගැටළුව ඉදිරිපත් කරන්නම ඕන. ඒත් ඔයිට වඩා ප්‍රවේසමෙන්.

අමරදේවයන් "ඈත කඳුකර හිමව් අරණේ" සිංදුව කියන විට පස්සෙන් ලී ඉරණ සද්දයක් ආවොත් ඒක ලොකු අපහසුවක්. මං කියන්නේ නෑ, ඒ තරම් දරුණුයි කියල. ඒත් පළුද්දක් තියෙනව. ඒත් රංගනයේදි උදේනි, හේමන්ත හා අනෙක් අය මේක වහගෙන ඉන්නේ.

ඒත් කලාකරුවගේ සමාජ වගකීම් පැත්තෙන් එය ඉතා උසස්. යුද්ධයට පසුබිම වන ජාතික ගැටළුව ගැන නිවැරදි දැනීම නැතිව කලාකරුවෙකුට විශේෂ කෘතියකට අත ගහන්න බෑ කියල මට කියන්න බෑ. අනෙක් අතට යුද්ධය තුළ මිනිස් හැඟීම්වල ආරවුල ගැන පතුලට යන්නේ නැතිව නියම කලාවක් බිහි කරන්නත් මේ යුගයේ බෑ. සජීර් හා චන්ද්‍රසේකරම් දෙන්න සිංහල නාට්‍යයට නව සරත්චන්ද්‍ර යුගයක් ඇති කරයි කියල මං දැන් අවුරුදු ගණනකට ඉස්සෙල්ලා කිව්ව. ඒක බොරු වෙන එකක් නෑ කියල මට ආයෙත් හිතෙනව. සුපර් ස්ටාර් කලාකරුවෙක් වෙන එක ජොලි වැඩක්. ඒත් ශ්‍රේෂ්ඨ කලාවක් ගොඩ නගන්නෙත් සුපර් මෑන්ල තමයි.